D139

# සිංහලයේ ව්‍යවහාර සංඛ්‍යා පිළිබඳ ජනශ්‍රැති විද්‍යාත්මක අධ්‍යයනයක්

VERIFICATION

දර්ශන සූරි (Ph.D.) උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන නිබන්ධයකි.

සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

University of Colombo Library Sri Lanka

UCLIB
583484

සන්ධ්‍යා කහඳගමගේ

2016 - පෙබරවාරි

# සංක්ෂිප්තය

'සිංහල සමාජයේ ව්‍යවහාර සංඛ්‍යා පිළිබඳ අධ්‍යයනයේදී සංඛ්‍යා පිළිබඳව මානව ප්‍රජාව තුළ පවතින දැනීම, විකාශය වීම සහ ජනශ්‍රැතික අංග සමග බද්ධ වීම සමාජීය තලයක තබා අධ්‍යයනය කිරීමේදී අංශ කිහිපයක් කෙරෙහි අපගේ අවධානය යොමු විය. කුඩා සංඛ්‍යාවේ සිට විශාල සංඛ්‍යාව දක්වා ගණනය කිරීමේදී, ප්‍රබල වන - නොවන සංඛ්‍යා, පූර්ණ හා භාග සංඛ්‍යා, ස්ත්‍රී - පුරුෂ ලිංගික සංඛ්‍යා, ඔත්තේ ඉරට්ටේ සංඛ්‍යා ආදී විවිධ වර්ග කිරීම් ඔස්සේ හඳුනාගැනීමට අවස්ථාව ලැබේ. සංඛ්‍යා භාවිතය තුළින් කාල කළමනාකරණය, වයස තීරණය කිරීම, වටිනාකම හා ප්‍රමාණාත්මක මිනීම, ක්‍රමවත් බව ප්‍රමුඛව යොදගනු ලැබිණ. සංඛ්‍යා භාවිතයේ ක්‍රමික ස්වභාවය ආදිවාසීන්ගේ සංඛ්‍යා භාවිතය, සෙල්ලිපි, පුරාතන ගද්‍ය හා පද්‍ය සාහිත්‍යය ඔස්සේ අධ්‍යයනයට ලක්විය. අක්ෂර සේම සංඛ්‍යාවත් මිනිස් ජීවිතයට බෙහෙවින්ම අදළ වේ. ඇතැම් විටෙක එය භාෂාව ඉක්මවා ප්‍රබල වන අවස්ථා පවතියි. අක්ෂර ගැන අවබෝධයක් නැත්තෙකු වුවත් සංඛ්‍යාත්මක බව, ප්‍රමාණය පිළිබඳව සවිඥනික වෙයි.

''සිංහලයේ ව්‍යවහාර සංඛ්‍යා පිළිබඳ ජනශ්‍රැති විද්‍යාත්මක අධ්‍යයනයක්'' යන මෙම පර්යේෂණයේදී ප්‍රමුඛ ගැටලුව බවට පත්වූයේ ව්‍යවහාර සමාජය ක්‍රියාත්මක වීම තුළ සංඛ්‍යා භාවිතයේ පදනම කෙසේද යන්නයි. එහිදී පුද්ගල ජනජීවිතය කෙරෙහි සංඛ්‍යා බලපාන ආකාරය පුද්ගලයා කේන්ද්‍ර කරගනිමින් ඔහු වටා ඇති භෞතික හා අභෞතික පරිසරය ස්පර්ශ කරමින් සොයා බැලෙයි.

මෙම නිබන්ධයේ අරමුණ වන්නේ සමාජීය කෘත්‍යය තුළ ජනශ්‍රැති විද්‍යාත්මකව සංඛ්‍යා භාවිතයේ ස්වභාවය හා ක්‍රියාකාරීත්වය අධ්‍යයනයයි. ඒ අනුව ජනශ්‍රැතිය සහ සංඛ්‍යාව හඳුනාගැනීමත් ලංකාවේ සංඛ්‍යා භාවිතයේ විකාශය හා එහි සමාජ කෘත්‍ය හඳුනාගැනීමත් පළමු පරිච්ඡේදයෙන් සිදුවේ. මානවයා වටා ඇති භෞතික පරිසරය සේම ඔහු වටා වන ආධ්‍යාත්මික පරිසරයත් අපගේ අවධානයට නතු වේ. ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව, මෙලොව උපන් මිනිසෙකු පසු කරන සංක්‍රාන්ති අවස්ථා හතර පිළිබඳව සංඛ්‍යාත්මක භාවිතය සහ විචල්‍යතාව හඳුනාගැනීමට දෙවන පරිච්ඡේදය වෙන් වේ. ඒ අනුව උපත, මල්වරය, විවාහය, මරණය යන සිව් අවස්ථා ප්‍රධාන කරගෙන එම අවතරණ අවස්ථාවන්ට සමීප සංසිද්ධි කෙරෙහිද අවධානය යොමු කරමින් එහි සංඛ්‍යාත්මක පදනම කෙබඳුද යන්න පරීක්ෂා කෙරෙයි. බිළිඳු උපතට පූර්වයෙන් හා පසුව, රන්කිරිකටගෑම, දෙරට වැඩීම, ඉඳුල් කටගෑම, කෙස් කැපීම, අකුරු කියවීම, කන් විදීම වැනි අවස්ථා උපත ඇසුරෙනුත්, පිරිමි දරුවෙකුගේ හා ගැහැනු දරුවෙකුගේ වැඩිවිය පැමිණීම මල්වරය ඇසුරෙනුත්, මනාලියක හා මනාලයකු අතිනත ගැනීම සඳහා වන පූර්ව මංගල චාරිත්‍ර හා පශ්චාත් මංගල චාරිත්‍ර විවාහය ඇසුරෙනුත්, මරණාසන්න අවස්ථාවේ සිට මිය ගිය අය වෙනුවෙන් කරන අවමංගල්‍ය චාරිත්‍ර මරණය ඇසුරෙනුත් සාකච්ඡා කෙරේ. ඒ අනුව ජන ජීවිතයට සංඛ්‍යා භාවිතය සමීපව පවතින ආකාරය අධ්‍යයනයට ලක්වේ. තෙවන පරිච්ඡේදයෙන් පුද්ගලයාගේ ඇදහිලි විශ්වාස පද්ධතිය

ස්පර්ශ කරමින් ආගම, අභිචාර, ජ්‍යොතිෂය සහ ජන වෙදකම සමග සංඛ්‍යා භාවිත වීමේ ස්වභාවය, සංඛ්‍යාවන්හි අගය මානව චින්තනය තුළ කෙබඳු ආකාරයෙන් ක්‍රියාත්මක වේද යන්න පිළිබඳව පරීක්ෂා කෙරෙයි. සිව්වන පරිච්ඡේදය මගින් පුද්ගල විශ්වාසයන්හි අංක භාවිතය පමණක් නොව ශාස්ත්‍ර අධ්‍යයනයන් කෙරෙහි සංඛ්‍යාත්මක දයකත්වයද සැකෙවින් පරීක්ෂාවට ලක්වෙයි.

අතීත, වර්තමාන සහ අනාගත යන කාලත්‍රයෙහිම කායික මානසික ක්‍රියාකාරීත්වය, විනෝදය ලබාගැනීමේ ක්‍රමවේදය වෙනස් වුවත් සංඛ්‍යාවන්හි අවශ්‍යතාව පසක් කරන ක්‍රීඩාව පිළිබඳව පස්වන පරිච්ඡේදයෙන් සහ ජීවන වෘත්තිය සමග සංඛ්‍යාවන්හි සබඳතාව හා සුවිශේෂත්වය හයවන පරිච්ඡේදයෙන් ඉදිරිපත් වෙයි. හත් වන පරිච්ඡේදය ජන සාහිත්‍යය සමග සංඛ්‍යාවන්හි ක්‍රියාකාරීත්වය අධ්‍යයනයට වෙන් කෙරී ඇත. එසේම ජනකතාවේ විවිධ ස්වරූප, ජන කවි, පිරුළු හා තේරවිලි භාවිතය තුළ, එනම් ජන සාහිත්‍යය තුළ සංඛ්‍යාවට හිමි වී ඇති ස්ථානිය අගය හඳුනාගැනීමට වෙන් වෙයි. මේ සියල්ලෙහි සමාලෝචනයක් අවසානයේ එයි.

නිබන්ධය අවසානයේ දක්නට ඇති උපග්‍රන්ථය තුළ පරිච්ඡේදයන්හි සැකෙවින් දක්වන ලද ඇතැම් සටහන් සඳහා විස්තරාත්මක වූ පූර්ණ සටහන් එකතු කොට ඇත. මේ යටතේ "දරු උපතේ කීම" නම් කවිපෙළ, ලංකාවේ භාවිත පැරණි ඉලක්කම් ක්‍රම සහ එහි රූපමය ස්වභාවය, මන්ත්‍ර, යන්ත්‍ර කිහිපයක හා නිමිති කිහිපයක රූප සටහන් කිහිපයක් අන්තර්ගත වේ. මෙම කෘතියේ එන විශේෂ වදන් එකතු කොට එහි අර්ථ සහිතව ශබ්දවලියක්ද ඊට අමතරව මෙම පර්යේෂණයට අදාළව තොරතුරු සැපයූ දත්ත දයකයන්ගේ නාමාවලියක්, පර්යේෂණ සහායක නාමාවලියක් සහ ආශ්‍රය කළ ග්‍රන්ථ හා ලේඛන නාමවලියක්ද එකතු කොට ඇත.

වර්තමානය වනවිට ජනප්‍රිය විෂය ක්ෂේත්‍රයක්ව ඇති ජනශ්‍රැතිය බොහෝ දෙනාගේ අධ්‍යයන ක්ෂේත්‍රය බවටද පත්ව ඇත. එම පර්යේෂණ වඩාත් යොමුව ඇත්තේ සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික පදනමින් යුත් මානව විද්‍යාත්මක දෘෂ්ටිකෝණ වෙතය. මෙම පර්යේෂණය සංඛ්‍යා කෙරෙහි ප්‍රමුඛ අවධානයක් යොමු කරවයි. එමගින් සමාජ කෘත්‍යාත්මකව සංඛ්‍යා භාවිතයේ ප්‍රායෝගික තත්ත්වය හඳුනාගැනීමට උත්සාහ කෙරේ. බුද්ධාගම තුළ සංඛ්‍යා සඳහා ප්‍රබල ස්ථානයක් හිමි වී තිබේ. බෞද්ධ දර්ශනයේ පවතින විවිධ කරුණු සංඛ්‍යාත්මක පදනමකින් සම්පිණ්ඩනය කිරීම මගින් එකී ධර්ම කරුණු පැහැදිලිව මතකයේ තැන්පත් කර ගත හැකිය. සංඛ්‍යාවට ප්‍රමුඛත්වය දෙමින් බොදු ජන ජීවිතය හා බද්ධ වී ඇති සංඛ්‍යාර්ථ වාචී පද පිළිබඳව ලියවුණු කෘති කිහිපයක් පවතියි. සිරිමල් සුවඳරත්න මහතාගේ සංඛ්‍යාත්මක යෙදුම් පැවසුම් සංඛ්‍යාර්ථ, වලතර සෝහිත නාහිමිගේ සංඛ්‍යා ධම්ම, හල්කඳලියේ ජේමාලංකාර හිමිගේ දම් සයුරෙන් නැණ සයුරට වැනි කෘති ආගමික කරුණු ඇසුරෙන් ලියවුණු කෘති වේ. ආනන්ද එන්. තිලකරත්න මහතාගේ පොකුරු සංඛ්‍යා කෘතිය කිසියම් සංචිතයක් හඳුනාගැනීම සඳහා යොදනු ලැබූ නාම සහිත කෘතියකි. ආගමික

කරුණුවලට ප්‍රමුඛත්වයක් ලබා දුන්නද සෙසු විෂය ක්ෂේත්‍ර කෙරෙහිද සංඛ්‍යාත්මක පදනමකින් යොමු වූවකි.

පියසේන කහඳගමගේගේ **දිගාමඩුලු ජනවහර**, **දකුණු පළාතේ කතාබහ**, කේ. බී. මානැවගේ **නුවර කලාවියේ ජනවහර**, **ලග්ගල ජනවහර** සහ **මහතලා ජනවහර**, මුදියන්සේ දිසානායකගේ **දෙමළ හත්පත්තුවේ ජනවහර** ජේ. බී. දිසානායකගේ **උඩරට සිංහලය**, සඳරුවන් ලොකුහේවාගේ **බින්තැන්නේ සිංහලයෝ** ප්‍රදේශයක් කේන්ද්‍ර කරගෙන ප්‍රාදේශීය උපභාෂාවට ප්‍රමුඛත්වයක් දෙමින් ලියවුණු කෘති වේ. ශබ්ද, පද, වාක්‍ය හා ව්‍යාකරණමය වශයෙන් හා උච්චාරණ ස්වරූපය අනුව ප්‍රදේශයට ආවේණික බසෙහි පවත්නා සුවිශේෂත්වය අධ්‍යයනයට මෙම කෘති ප්‍රමුඛත්වය දී ඇත. භාෂා අධ්‍යයනය ඔස්සේ ප්‍රදේශයේ පවතින සංස්කෘතිකමය වටිනාකමකින් යුතු අංග කෙරෙහි කතුවරයාගේ අවධානය යොමු වීම මෙහි විශේෂත්වයයි. ආහාරපාන, ඉඳුම්හිටුම්, ගොවිතැන, ඇවතුම් පැවතුම්, බැණ දෙඩීම්, සිරිත්විරිත්, ජීවිතයේ සංක්‍රාන්ති අවස්ථා, පරිසරය, කාලය, ලෙඩරෝග, උපහැරණ, යුගළ පද ආදි විවිධ අංශ පිළිබඳව අධ්‍යයනය කිරීම මගින්ද ප්‍රදේශයේ ස්වරූපය නියෝජනය වේ. ඒ අනුව මෙම කෘතිවල අතරින් පතර සංඛ්‍යාත්මක යෙදුම් භාවිත වී ඇත. ඇතැම් සංඛ්‍යාර්ථවාචී පද පිළිබඳ අර්ථකථනද පවතියි. මේ අනුව සංඛ්‍යා පිළිබඳ අවධානය යොමු වී පවතින නමුත් සංඛ්‍යාවට ප්‍රමුඛත්වය දෙමින් කෘතියක් නිර්මාණය වී නැත. ජේ. බී. දිසානායකගේ **සිංහල ජනවහර**, පියසේන කහඳගමගේගේ **ප්‍රාදේශීය ව්‍යවහාර**, බසට ප්‍රමුඛත්වය දෙමින් පොදුවේ ලංකාවේ බහුතර ප්‍රදේශ නියෝජනය කළ කෘති වේ. එහි අරමුණද භාෂාවට ප්‍රමුඛත්වය දෙමින් ජන සංස්කෘතිය අධ්‍යයනය කිරීමයි.

කේ. බී. මානැව මහතාගේ **නුවර කලාවියේ ජනමංගල්ල**, පියසේන කහඳගමගේගේ **බින්තැන්නේ විත්ති**, **මාදුටු බින්තැන්න**, ඇන්. ටී. කරුණාතිලකගේ **බෙම්ගගබඩ විත්ති**, තිස්ස කාරියවසම්ගේ **ගම්මඩු පුරාණය**, ගුණසේකර ගුණසෝමගේ **පානම්පත්තුවේ ජන ඇදහිලි හා විශ්වාස**, ඔරුක්මාන්කුලමේ වන්දන හිමිගේ **හුරුලු මංගල්ලය**, මුදියන්සේ දිසානායකගේ **කිල්ල හා කොටහලුව**, **වන්නියේ දෙවිදේවතා සම්භවය හා ව්‍යාප්තිය**, ලයනල් බෙන්තරගේ **කළුකුමාර යාග පිළිවෙළ**, සුනන්ද මහේන්ද්‍රගේ **පුරාණෝක්ති සංග්‍රහය**, **ජන කියමන් පොත** ආදි කෘති ලංකාවේ එක් ජන ප්‍රදේශයක් කේන්ද්‍ර කරගත් ජනශ්‍රැති අධ්‍යයන වේ. එසේත් නැතහොත් කිසියම් ජනශ්‍රැති අංගයක් කේන්ද්‍ර කොටගෙන නිර්මිත කෘති වේ. එම අධ්‍යයන තුළ සංඛ්‍යාර්ථවාචී පද භාවිත වේ. එමෙන්ම සංඛ්‍යාවට අදාළ වූ ජනශ්‍රැතිද පවතියි. එසේ වුවත් ඒ කෘති කිසිවක් සංඛ්‍යාවට ප්‍රමුඛත්වය ලබා දෙමින් ඒ අනුව ජනශ්‍රැති අධ්‍යයනය කළ කෘතිද නොවේ.

පියසේන කහඳගමගේගේ **කමත**, **කුඹුර**, **කෙම්පහන්**, **ධීවර භාෂාව**, සන්ධ්‍යා කහඳගමගේගේ **ගොවිබස** වෘත්තිය ව්‍යවහාර හා චාරිත්‍ර පදනම් කරගත් කෘතිය. සිරි ලියනගේගේ **ජනශ්‍රැති ශබ්දකෝෂය**, මුදියන්සේ දිසානායකගේ **නර්තන වාක්කෝෂය** ඇතුළු කෝෂ ග්‍රන්ථ තුළද සංඛ්‍යා සම්බන්ධ වූ ව්‍යවහාර පවතියි. එහෙත් එම කෘති

කෝෂ ග්‍රන්ථ විනා සංඛ්‍යා කේන්ද්‍ර ගත වූ කෘති නොවේ. හෙන්ද්‍රික් ද සිල්වාගේ ජීවිතය හා ග්‍රහයෝ ආදි කෘතිවල සංඛ්‍යාත්මක පසුබිමක් පවතියි. එසේ වුවත් එම කෘති සංඛ්‍යා යොදාගෙන ඔවුන්ගේ ශාස්ත්‍රය අධ්‍යයනය කරන කෘති වේ. ජ්‍යොතිෂය හදාරනු ලබන්නේ සංඛ්‍යා පදනම් කරගෙනය. සංඛ්‍යා පසුබිම් කරගෙන මාත්‍රා භාවිත කරමින් සෙත්කවි, වස්කවි මෙන්ම කාව්‍ය ශාස්ත්‍රය පිළිබඳව අධ්‍යයනය කිරීම ඡන්දස් කවි පොත් මගින්ද සිදුවේ. මෙමගින් ඔවුන් සංඛ්‍යා භාවිත කළද ඒ තුළින් නිර්මාණය කෙරෙන විෂය පථය කෙරෙහි විනා සංඛ්‍යාව පිළිබඳ ප්‍රමුඛ අධ්‍යයනයක් සිදුවී නැත.

හර්ෂ විජේවර්ධන 2009 දී රචනා කළ ''සිංහල භාෂාවේ සංඛ්‍යාංකනය'' යන කෘතිය ලියවෙන්නේ මයිකල් එවර්සන් නම් අයිරිෂ් ජාතිකයා සිංහලයට ඉලක්කම් තිබුණා යැයි 2005 දී පමණ කරන ලද ප්‍රකාශයෙන් පසුවය. එහිදී ලංකාවේ භාවිතව ඇති සංඛ්‍යා ක්‍රමවේද ගැන දක්වයි. එහෙත් එහිදී ශ්‍රැතිය අවධානයට ලක්ව නැත. Stith Thompson ජනශ්‍රැති පිළිබඳ අධ්‍යයනය කළ ශාස්ත්‍රඥයෙකි. ජනශ්‍රැති ව්‍යුහය හා සංඛ්‍යා පිළිබඳව ඇති සම්බන්ධය ඔහු අධ්‍යයනය කළේය. ඉංග්‍රීසි හෝඩිය සම්බන්ධ දර්ශක හඳුන්වා දුන්නේය. The Folktale (1946), Indian of Folk literature (1955) වශයෙන් කෘති ලියමින් සහ සඟරා වෙළුම් ගණනාවක් සංස්කරණය කරමින් ජනශ්‍රැතියට අගනා මෙහෙයක් කළේය. සංඛ්‍යා සම්බන්ධ කරගෙන ඔහු සිය පර්යේෂණ සිදුකළද එය ලංකාවට අදාළ වූවක් නොවේ. ඒ ඒ දේශය අනුව සංඛ්‍යා පිළිබඳ ශ්‍රැතිය වෙනස් වේ. Numbers in Folklore නම් අන්තර් ජාල පිටුවෙහි 3, 5, 7 විශේෂ වන්නේ කවර හේතු නිසාද යන්න දක්වා තිබේ. අංක 03 මොළය පිළිබඳ සුවිශේෂත්වයක් දක්වන බව ඔහු පවසයි. ඒ අනුව මොළයේ කේතුව, පිටියුටරි ග්‍රන්ථය හා කේන්ද්‍රීය තැලමසය ප්‍රබල වේ. ලංකාවේදී අංක 03 ප්‍රබල වන්නේ මරණය හා සම්බන්ධ වන බැවිනි. මධ්‍යකාලීන ජර්මනියේ පුද්ගලයන්ට (මායා) දිව්‍ය ලෝකයට ඇතුළු විය හැක්කේ අංක 09නි. එහෙයින් එය සුබ අංකයකි. එහෙත් අංක 09 ලාංකිකයන්ට අදාළ නොවේ. ඔවුන්ට 09 සුබ ලකුණකට වඩා නපුරු අසුබ ලකුණු උදා කරවන බව විශ්වාස කෙරේ.

සංඛ්‍යා සම්බන්ධ කරගෙන අංක විද්‍යා පොත් පත් රැසක් ඉංග්‍රීසි බසින් මෙන්ම සිංහල බසින්ද රචනා වී ඇත. එමෙන්ම රචනා වෙමින් පවතියි. එම කෘතිවල සංඛ්‍යා කෙරෙහි විශේෂත්වයක් පවතියි. එහෙත් එම කෘති මගින් සිදු කෙරෙන්නේ සංඛ්‍යා සම්බන්ධ ශාස්ත්‍රයකි. ඒ අනුව විවිධ අනාවැකි පැවසීමකි. සංඛ්‍යාව පිළිබඳ ජනශ්‍රැතිය එම කෘති මගින්ද උක්ත නොකෙරෙයි. ඉහත දක්වූ අයුරින් සංඛ්‍යා සහ සංඛ්‍යා පිළිබඳ ශ්‍රැතිය විවිධ විෂය ක්ෂේත්‍ර අළලා ලියන ලද කෘතිවලින් ඉඟිහිට ඇඟිඳ ගැනීමට හැකිවේ. මන්ද ඒ කිසිවක් සංඛ්‍යා සම්බන්ධ ශ්‍රැතිය කෙරෙහි යොමු වූ කෘති නොවන බැවිනි. සංඛ්‍යා පිළිබඳව ලාංකේය ජනයා තුළ පවතින විශ්වාස සහ ක්‍රමවේද කෙරෙහි යොමු වූ කෘති දක්නට නොලැබෙන බැවින් - ජනශ්‍රැති විද්‍යාත්මකව සංඛ්‍යා අධ්‍යයනයක් ක්‍රමවත්ව මෙතෙක් සිදුවී නැති බැවින් මෙමගින් එම ක්ෂේත්‍රය යම්තාක් දුරකට ඌනපූරණය කෙරෙයි. සංඛ්‍යා කෙරෙහි සමාජීය ආකල්පය හා කෘත්‍යාත්මක බලවේගය න්‍යායාත්මකව හඳුනාගැනීම තුළින් ප්‍රායෝගික තලයේ ක්‍රියාකාරකම් සඳහා එය යොද

ගත හැකිය. මිනිසා තුළ ඇතිවන තිගැස්ම සමාජ ඒකාබද්ධ කරන ඒකකයක් බව හැඳිනගැනීම තුළින් සමාජ ඒකීයත්වය ගොඩනැගීමෙහිදී එම සංඛ්‍යාත්මක පදනම විවිධ අයුරින් උපයෝගී කරගැනීමට අවස්ථාව ලැබේ. ඒ අනුව යම් ප්‍රතිපත්ති සම්පාදනයෙහිලාත් මෙය වැඩදයක කර ගැනීමට හැකිවේ. මේ අනුව මෙම පර්යේෂණය අංශ කිහිපයකින්ම එක සේ වැදගත් වෙයි.

මෙම අධ්‍යයනය ක්‍රියාත්මක වූයේ සීමිත ක්ෂේත්‍රයක් පමණක් කේන්ද්‍ර කරගෙන නොවේ. එසේ වුවත් සිංහල ප්‍රදේශ පමණක් තෝරා ගැනීම මෙහිදී එක් සීමාවක් බවට පත් කරගනු ලැබුණු අතර ලංකාවට අදළ වන පරිද්දෙන් තොරතුරු ලබා ගැනීමට උත්සාහ කෙරිණ. දත්ත ලබාගැනීමේදී ඍජුව මා විසිනුත් පර්යේෂණ සහායකයන් මගිනුත් තොරතුරු ඒකරාශී කරගනු ලැබිණ. එහිදී සමීක්ෂණ ක්‍රමවේදයට අදළව මූලික දත්ත ඒකරාශී කර ගැනීමේදී ප්‍රශ්නමාලා ක්‍රමය (Questionnaire) මගින් ප්‍රමාණාත්මක දත්ත එක්කර ගැනීම සිදුවිය. කේන්ද්‍ර ගත සම්මුඛ සාකච්ඡා (Focus Group Discussion) සහභාගී නිරීක්ෂණය (Participatory Observation) සහභාගී නොවන නිරීක්ෂණය (Non Participatory Observation) මගින් ගුණාත්මක දත්ත ඒකරාශී කර ගැනීම සිදුවිය. ඒ අනුව ගාල්ල, මාතර, හම්බන්තොට, රත්නපුර, මොනරාගල, මහියංගණය, අම්පාර, පොළොන්නරුව අනුරාධපුර, පුත්තලම, කුරුණෑගල, කෑගල්ල, මීගමුව, නුවර, මාතලේ, කොළඹ, කලුතර ආදී ප්‍රදේශ යම්තාක්දුරට ආවරණය කිරීමට හැකිවිය. සංඛ්‍යා ආශ්‍රිත තොරතුරු වැඩි ප්‍රමාණයක් රජරට නුවරකලාවිය කලාපයෙන් හඳුනාගැනීමට ලැබීමද විශේෂත්වයකි. ද්විතීයික මූලාශ්‍රය යටතේ පොත්පත් ලිපිලේඛන අධ්‍යයනයද සිදුවිය. එහිදී මූල ග්‍රන්ථ හා ද්විතීයික ග්‍රන්ථ අධ්‍යයනයද සිදුවිය. විශේෂයෙන්ම ඒ ඒ පළාත් පිළිබඳව ලියැවී ඇති මානව සමාජ වටිනාකමකින් යුතු ජනශ්‍රැති එක්රැස් වූ ග්‍රන්ථ සහ ජනශ්‍රැති පර්යේෂණ කෘති කෙරෙහිත් ප්‍රමුඛ අවධානයක් යොමුවිය. සමාජ පර්යාය නැතහොත් සමාජ රටාව අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ප්‍රකට හා නිළින කෘත්‍ය වශයෙන් සංඛ්‍යාව දක්වන ප්‍රබලත්වය මෙමගින් අධ්‍යයනයට ලක්වේ.

මෙම නිබන්ධයේදී පද බෙදීම සඳහා ග්‍රන්ථ සංස්කාරකවරුන්ගේ ක්‍රමවේදය අනුගමනය කර ඇති අතර ඍජු උද්ධෘත දක්වීමේදී එම ලේඛකයාගේ කෘතියෙහි දක්වෙන ක්‍රමවේදය භාවිත කොට ඇත.

ජන ජීවිතයට ප්‍රබල ලෙසින් බලපාන නමුත් සංඛ්‍යා භාවිතය කෙරෙහි මෙතෙක් අවධානය යොමු නොකළ ශාස්ත්‍ර ගවේෂකයන්ගේ විමසුම් ඇස ඊට යොමු වේවායි පතමි.

සන්ධ්‍යා කහඳගමගේ